ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා සමාගම - 2021

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා සමාගමේ (“සමාගම) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.7 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හිටපු සභාපති/ප්‍රධාන විධායක නිලධාරියා 2020 අගෝස්තු මාසයේදී සියයට බිංදුවක පොලී අනුපාතයක් සහිතව රුපියල් මිලියන 9.753 ක වාහන ණයක් ලබාගෙන ඇති අතර එම ණය මුදලින් සියයට 50 ක් වන රුපියල් මිලියන 4.876 සමාගම විසින් දරනු ඇත. කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරය විසින් එම තනතුර ප්‍රතිස්ථාපනය කිරීම හේතුවෙන් වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ නොකළ බැවින් සමාගම විසින් දරන ලද සියයට 50 ක කොටස ඇතුළුව හිඟ මුළු ණය මුදල 2021 අගෝස්තු 20 වන දින හිටපු සභාපති / ප්‍රධාන විධායක නිලධාරියා විසින් පියවා ඇත. | හිටපු සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට අනුව සභාපතිවරයා ලෙස නොව ප්‍රධාන විධායක නිලධාරියාට හිමි වරප්‍රසාද පමණි | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යන ගැටුම්කාරී භූමිකාවන් දෙක වෙන් කිරීම නිර්දේශ කෙරේ. කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රමය තවදුරටත් සමාලෝචනය කර ණය මුදල සම්පූර්ණයෙන් අය කර ගැනීම සහ ලබා දී ඇති කාර්ය මණ්ඩල ණය සඳහා සාධාරණ පොලියක් අය කිරීම. |

**1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 ජූලි 18 දිනැති අංක 03/2018 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය | එම චක්‍රලේඛයට අනුව ඉදිරියේදී මහා භාණ්ඩාගාරයේ, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව සේවකයන් බඳවා ගැනීමෙන් සහ ඔවුන්ගේ සේවකයන්ගේ වැටුප් හා දීමනා වැඩි කිරීමෙන් අදාළ බලධාරීන් වැළකී සිටිය යුතුය. විධිවිධානයට පටහැනිව පහත දෑ සිදු කර ඇත. | සමාගමේ සාංගීරමික ව්‍යවස්ථාවට අනුව සභාපති සහ අධ්‍යක්ෂක විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩල වැටුප් පරාසයන් සහ දීමනා යෝජනා ක්‍රම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට මානව සම්පත් සඳහා පරිචයක් නොමැත. | චක්‍රලේඛයේ II ඡේදයට අනුව සේවකයින් බඳවා ගැනීමට සහ ඔවුන්ගේ වැටුප් හා දීමනා වැඩි කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය අවශ්‍ය වේ. සමාගමේ ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීමේදී සමාගම විසින් අදාළ බලධාරීන් විසින් කලින් කලට නිකුත් කරන උපදෙස් පිළිපැදිය යුතුය. |

| | | |
|---|---|---|
| (i) සමාගමේ නිලධාරීන් හය දෙනෙකු සඳහා ශුන්‍ය පොලී අනුපාතය යටතේ රුපියල් මිලියන 34.93ක කාර්ය මණ්ඩල වාහන ණය ප්‍රදානය කර තිබුණි. ණය මුදලින් සියයට පනහක් වූ රු. මිලියන 17.46 ක් සමාගම විසින් දරනු ලැබේ. | සීමාසහිත ෂෙල් ගෑස් ටර්මිනල් ලංකා සමාහම විසින් මෝටර් රථ ප්‍රතිපත්තිය හඳුන්වා දුන් අතර පසුව සමාගම විසින් බොහෝ සංශෝධන සිදු කරන ලදී. සභාපතිවරයා සමාගමේ සාංගීරමික ව්‍යවස්ථාව යටතේ අනුකමිටුවක් පත් කර ඇත. ඔවුන් දැනට පවතින මෝටර් රථ ප්‍රතිපත්තිය වැඩිදියුණු කිරීම නිර්දේශ කර ඇත | කාර්ය මණ්ඩල වාහන ණය යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභීන්ද අනුකමිටුවේ සාමාජිකයන් වන බැවින් ලැදියාවන් අතර ගැටුමක් නිරීක්ෂණය වී ඇති බැවින් සභාපතිවරයා විසින් පත් කරන ලද අනුකමිටුව විසින් කරන ලද නිර්දේශ පිළිගත නොහැක. එබැවින්, කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රමය සමාලෝචනය කර ණය මුදල සම්පූර්ණයෙන් අයකර ගැනීම සහ අනෙකුත් රජයේ සමාගම් මෙන් ප්‍රදානය කරනු ලබන කාර්ය මණ්ඩල ණය සඳහා සාධාරණ පොලියක් අය කිරීම නිර්දේශ කෙරේ. වැඩිදුර උපදෙස් මහා භාණ්ඩාගාරයේ, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක. |
| (ii) 2020 අගෝස්තු මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි නිලධාරීන් හය දෙනාගේ මාසික වාහන දීමනාව සියයට 30 කින් වැඩි කර ඇත. නව මාසික වාහන දීමනාව රු. 143,000 සිට රු. 300,300 අතර වේ. | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා සමාගම හි කමිටු නිර්දේශ සහ මෝටර් රථ ප්‍රතිපත්තියට අනුකූලව දීමනා ගෙවනු ලබයි. | සමාගම මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය. තවද මාණ්ඩලික වාහන ණය යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභීන් වූ අනු කමිටුවේ සාමාජිකයින්ගේ ලැදියාව අතර ගැටුමක් නිරීක්ෂණය වී ඇති බැවින් අනුකමිටුව විසින් කරන ලද නිර්දේශ පිළිගත නොහැක. |
| (iii) රකියා ආශ්‍රිත වාහන ණය සඳහා හිමිකම් නොලබන නිලධාරීන්ගේ මාසික වාහන දීමනාව 2020 අගෝස්තු මස සිට ක්‍රියාත්මක වන පරිදි වැඩි කර ඇත. නව මාසික වාහන දීමනාව රු. 15,000 සිට රු. 50,000 අතර වේ. | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා සමාගම හි කමිටු නිර්දේශ සහ මෝටර් රථ ප්‍රතිපත්තියට අනුකූලව දීමනා ගෙවනු ලබයි. | සමාගම මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතු අතර වාහන දීමනා සඳහා හිමිකම් නොලබන සේවකයින්ට වාහන දීමනා ගෙවීමෙන් වැළකී සිටිය යුතුය. |
| (iv) 2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ එක් එක් පුද්ගලයාගේ වැටුප මත 5% සිට 40% දක්වා වෙළඳපල වැටුප් ගැලපීම මත පදනම්ව වැටුප් සංශෝධනයක් සිදු කර | පරිචයක් ලෙස සමාගමේ වේතන ප්‍රතිලාභ තීරණය කරනු ලබන්නේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී සහ | අදාළ බලධාරීන් විසින් කලින් කලට නිකුත් කරන උපදෙස්වල වෙනස්කම් අනුව සමාගමේ භාවිතය සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| ඇත. | අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය මත වැටුප් හා ප්‍රතිලාභ සමීක්ෂණය ක්‍රියාත්මක කිරීම PWC විසින් සිදු කරන ලදී. වැටුප් කමිටු නිර්දේශ අනුව සියලුම කාර්ය මණ්ඩල වැටුප් ක්‍රියාත්මක කර ඇති අතර සේවක ව්‍යුහ සහ වැටුප් ව්‍යුහය පිළිබඳ සියලු විස්තර ඇතුළත් ලිපියක් රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | |
| (v) සමාගමේ සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී වෙත රුපියල් 150,000 ක මාසික විනෝදාස්වාද දීමනාව 2020 සිට ගෙවනු ලැබේ. | සමාගම තුළ MD/CEO හට මාසික ගෙවීමක් සිදු කිරීම අඛණ්ඩ පරිචයකි. විනෝදාස්වාද දීමනාව ඇතුළුව ප්‍රධාන විධායක නිලධාරියාගේ වේතනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර සමාගම නිසි අමාත්‍යාංශයට සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට නිසි ලෙස දැනුම් දෙන ලදී. | සමාගමේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ ගැටුම්කාරී භූමිකාවන් දෙක තනි පුද්ගලයෙකු විසින් දරනු ලබයි. එබැවින්, ඔහුගේම ප්‍රතිලාභ තීරණය කිරීමේදී ලැදියාව අතර ගැටුමක් ඇති වේ. එබැවින්, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට සන්නිවේදනය කිරීම පමණක් ප්‍රමාණවත් නොවන අතර භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය අවශ්‍ය වේ. |
| (vi) ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් (LGLL) හි සභාපති/ප්‍රධාන විධායක නිලධාරියා ද වන සමාගමේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරී වෙත රුපියල් 575,000ක මාසික වැටුපක් LGLL හි සභාපති/ප්‍රධාන විධායක නිලධාරියාගේ වැටුපෙන් සියයට 50ක් ලෙස 2020 සිට ගෙවනු ලැබේ. | ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා සමාගමේ හි ප්‍රධාන විධායක නිලධාරියාගේ වැටුප 2020 ජූලි 31 දිනට අනුමත කිරීම- ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ප්‍රධාන විධායක නිලධාරියෙකු | සමාගමේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ ගැටුම්කාරී භූමිකාවන් දෙක තනි පුද්ගලයෙකු විසින් දරනු ලබයි. එබැවින්, ඔහුගේම ප්‍රතිලාභ තීරණය කිරීමේදී ලැදියාව අතර ගැටුමක් ඇති වේ. එබැවින්, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට සන්නිවේදනය කිරීම පමණක් ප්‍රමාණවත් නොවන අතර |

| | | | |
|---|---|---|---|
| | | ලෙස මූලික වැටුපෙන් 50%ක් පමණක් ලබා ගනී. | භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය අවශ්‍ය වේ. |
| (ආ) 2015 මැයි 25 දිනැති අංක 01/2015 රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ සහ 2016 ඔක්තෝබර් 27 දිනැති අංක 01/2015(i) රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය. | චක්‍රලේඛවලට අනුව, ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන මෙහෙයුම් නිලධාරි සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද තනතුරක් දරන සහ ඕනෑම SOE එකක HM 1-1 කාණ්ඩයට සමාන හෝ ඉහළින් ස්ථානගත කර ඇති ඕනෑම නිලධාරියෙකුට එක් නිල වාහනයක් පමණක් භාවිතා කිරීමට අයිතියක් ඇත. මසකට පිළිවෙළින් ලීටර් 140 සහ 120 ට සමාන ඉන්ධන දීමනාවක් සහ ඉහත නිලධාරීන්ට නිල වාහනයක් හෝ රුපියල් 50,000 ක මාසික දීමනාවක් සහ මාසික ඉන්ධන දීමනාවක් ලබා දිය හැකිය. චක්‍රලේඛවලට පටහැනිව;<br>(i.) නිල වාහනයට හිමිකම් නොලබන ඇතැම් නිලධාරීන්ට නිල වාහන හෝ මාසික දීමනාවක් ලබා දී තිබුණි.<br>(ii.) රුපියල් 50,000 ක මාසික දීමනාව ඉක්මවා මාසික වාහන දීමනාව රු. 143,000 සිට රුපියල් 300,300 ක් නිලධාරීන් හය දෙනෙකු (06) සඳහා ගෙවා ඇත.<br>(iii.) නිලධාරීන් හය දෙනෙකු (06) සඳහා මාසික ඉන්ධන දීමනාව වන ලීටර් 140 හෝ 120 ඉක්මවන ලීටර් 200 සිට ලීටර් 320 දක්වා මාසික ඉන්ධන දීමනාව ලබා දේ. | චක්‍රලේඛයට අනුව, මෙම චක්‍රලේඛයේ දක්වා ඇති දීමනා ලිට්‍රෝ ගෑස් ලිමිටඩ් අනුබද්ධිත සමාගමක් යටතට වැටෙන බැවින් එයට අදාළ නොවේ. සභාපතිවරයාට, ප්‍රධාන විධායක නිලධාරියාට, අධ්‍යක්ෂ මණ්ඩලයට දීමනා ගෙවීම තරඟකාරී වෙළඳපල මිල ගණන් සැලකිල්ලට ගෙන අදාළ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ. ඒ අනුව PED 01/2015 වෙනුවට සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකුගෙන් සමන්විත මණ්ඩලය විසින් අනුමත කරන ලද මෝටර් රථ ප්‍රතිපත්තිය අනුගමනය කරන ලදී. | මෝටර් රථ ප්‍රතිපත්ති අධ්‍යයනය කිරීම සඳහා පත්කළ අනුකමිටුව විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ පිළිගත නොහැක්කේ ලැදියාවන් අතර ගැටුමක් නිරීක්ෂණය වී ඇති බැවිනි. මෙම ප්‍රතිපත්තිය යටතේ අනුකමිටු සාමාජිකයින්ද ප්‍රතිලාභීන් වේ. තවද අනුබද්ධිත ආයතන මෙම චක්‍රලේඛයෙන් බැහැර කර නොතිබූ අතර මේ සම්බන්ධයෙන් කිසිදු පැහැදිලි කිරීමක් රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන නොතිබුණි. එබැවින් නිසි මගපෙන්වීම සහ භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව චක්‍රලේඛ උපදෙස් පිළිපැදීම නිර්දේශ කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස රජයේ අවශ්‍යතා සුරක්ෂිත කිරීම මහා භාණ්ඩාගාරයේ නියෝජිතයාගේ යුතුකමයි. |
| (ඇ) 2015 මැයි 25 දිනැති චක්‍රලේඛ අංක: PED 01/2015 පොදු ව්‍යවසාය චක්‍රලේඛය සහ 2020 ජනවාරි 27 | (i.) PED 01/2015 චක්‍රලේඛයට අනුව, නිලධාරියෙකු තනතුරු එකකට වඩා දරන්නේ නම්, ඔහුට ඔහුගේ අතිරේක තනතුර සඳහා නියම කර ඇති ඉන්ධන දීමනාව පමණක් ලබා ගැනීමට හිමිකම් ඇත. කෙසේ | සංගමික ව්‍යවස්ථාවලියේ අයිතම අංක 83, 76 , 77 ,78 වගන්තිවලට අනුව සහ 2020 පෙබරවාරි 21 සහ 2020 ජූලි 31 යන | සමාගමේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ ගැටුම්කාරී භූමිකාවන් දෙක තනි පුද්ගලයෙකු විසින් දරනු ලබයි. තවද, සභාපති, විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ |

| | | | |
|---|---|---|---|
| දිනැති PED 01/2020 රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය. | වෙතත්, සමාගම් දෙකෙහිම සභාපති/ප්‍රධාන විධායක නිලධාරියා වන සභාපති/ප්‍රධාන විධායක නිලධාරියා එම සමාගම් දෙක සඳහාම රු. 443,300 මාසික වාහන දීමනාවක් ලබාගෙන ඇති අතර මෙම මුදල 2020 ජනවාරි 27 දිනැති PED 01/2020 මගින් අවසර දී ඇති රුපියල් 50,000 මාසික දීමනාව ඉක්මවයි.<br><br>(ii.) PED 01/2020 විසින් අවසර දී ඇති ලීටර් 150 ක මාසික ඉන්ධන දීමනාව ඉක්මවන ලීටර් 500 ක මාසික ඉන්ධන දීමනාව සමාගමේ සභාපති / ප්‍රධාන විධායක නිලධාරී වෙත ලබා දෙනු ලැබේ.<br><br>(iii.) PED 01/2015 සහ PED 01/2020 ට පටහැනිව, රුපියල් 50,000 ක මාසික රියදුරු දීමනාවක් සමාගමේ සභාපති / ප්‍රධාන විධායක නිලධාරී වෙත ගෙවනු ලැබේ.<br><br>(iv.)PED 01/2020 චක්‍රලේඛයට අනුව, විධායක නොවන අධ්‍යක්ෂක (NED) සඳහා වන මුළු සහභාගී වීමේ දීමනාව මසකට රුපියල් 25,000 ක් වන අතර ඔහුට හිමිවන්නේ සහභාගී වීමේ දීමනාව පමණි. චක්‍රලේඛයට පටහැනිව;<br>• සහභාගී වීමේ දීමනාව තිදෙනාට (03) මණ්ඩල රැස්වීමකට රුපියල් 25,000ක් බැගින් ගෙවනු ලැබේ.<br>• මාසික වාහන දීමනාව රු. 100,000 NEDs තිදෙනාට රු. 100,000 (03) ගෙවනු ලැබේ. | දිනයන්හිදී පැවති මණ්ඩල රැස්වීම් සංදේශයට අනුව සභාපති, විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ නිරීක්ෂකයින් සඳහා දීමනා ගෙවීම සහ ප්‍රවාහන පහසුකම් සැපයීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. | නිරීක්ෂකයින් සඳහා දීමනා ගෙවීම සහ ප්‍රවාහන පහසුකම් සැපයීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ. එබැවින්, ඔහුගේම ප්‍රතිලාභ තීරණය කිරීමේදී ලැදියාව අතර ගැටුමක් ඇති වේ. එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ට ලැබෙන යම් ප්‍රතිලාභයක් සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියක් අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) 2018 දෙසැම්බර් 07 දිනැති අංක PED 03/2018 දරන පොදු ව්‍යවසාය චක්‍රලේඛය. | චක්‍රලේඛයේ විධිවිධාන අනුව එක් සේවකයෙකුට රුපියල් 13,500 ක ප්‍රසාද දීමනාවට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ සේවකයෙකු සඳහා රුපියල් 60,000 ක ප්‍රසාද දීමනාවක් ගෙවා ඇත. | ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා සහ ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම් දෙක සඳහාම CBA නොවන සේවකයින්ගේ වාර්ෂික කාර්ය සාධනය පදනම් කරගත් ප්‍රසාද දීමනාව තීරණය කරනු ලබන්නේ සාපේක්ෂ පුද්ගල කාර්ය සාධනය සහ සමාගමේ කාර්ය සාධනය මතය.ප්‍රසාද දීමනා ගෙවීමේ මාස ගණන CBA සේවකයාගේ ගෙවීමට සහ අපගේ මව් සමාගම වන SLIC විසින් ගෙවන මාස ගණනට අනුකූල විය යුතුය. ප්‍රසාද දිමනා ක්‍රමය වැටුප් කමිටුව විසින් නිර්දේශ කරන ලද අතර අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර ඇත. | සමාගම චක්‍රලේඛයේ උපදෙස් පිළිපැදිය යුතුය. කිසියම් අපගමනයක් අවශ්‍ය නම් භාණ්ඩාගාරයේ අනුමැතිය අවශ්‍ය වේ. |
| (ඉ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 රාජ්‍ය ව්‍යවසාය චක්රලේඛයේ හි 8.3.3 (C) වගන්තිය. | මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ප්‍රසාද යෝජනා ක්‍රමය යටතේ සමාගමේ සේවකයන් සඳහා රුපියල් මිලියන 7.26ක් ගෙවා තිබුණි. | පිරවුම් මෙහෙයුම්, සිලින්ඩර නඩත්තු, මෙහෙයුම් සහ ප්‍රවාහනය වැනි සේවා රැසක් මැන්පවර් සේවකයින් 200කට අධික සංඛ්‍යාවක් විසින් හසුරුවන අතර වේතන කමිටුව විසින් නිර්දේශ ලබාගෙන 2020 සහ 2021 වසර සඳහා වැටුප් කමිටුවක් හරහා වත්මන් වැටුප් ව්‍යුහය සමාලෝචනය කිරීමට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය | සමාගම චක්‍රලේඛයේ උපදෙස් පිළිපැදිය යුතුය. කිසියම් අපගමනයක් අවශ්‍ය නම් භාණ්ඩාගාරයේ අනුමැතිය අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | | ලබා දෙන ලදී. | |
| (ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනත. | එම විධිවිධානවලට අනුව, සමාගම ඇතුළු රජය සතු සමාගම්වල විගණනය සිදු කිරීම සඳහා රටේ උත්තරීතර නීතිය මගින් විගණකාධිපතිවරයා පත් කර ඇත. කෙසේ වෙතත්, ඉහත විධිවිධානවලට පටහැනිව 2020 සඳහා සමාගමේ විගණනය සිදු කිරීම සඳහා බාහිර පරිචයේ යෙදෙන විගණකවරයෙකු පත් කර තිබූ අතර ඔවුන් 2020 සඳහා සමාගමේ විගණනය සිදු කර ඇත. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විශේෂයෙන්ම 154 ව්‍යවස්ථාවේ විගණකාධිපතිවරයා ගේ විෂය පථයට අයත් ආයතන එහි විගණන කාර්යයන් සඳහා පැහැදිලිව දක්වා ඇත.<br><br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනයේදී 154 වැනි ව්‍යවස්ථාව විශේෂයෙන් එහි සංශෝධනය කරන ලද සිංහල පාඨය අර්ථ ව්‍යාකූල බව හා එමගින් කවර හෝ අපැහැදිලි බවක් ඇති බැවින් ඉවත් කරන ලදී. කෙසේ වෙතත්, LGLL සහ LGTLL විගණකාධිපතිවරයා ගේ විගණනය යටතට පත් වන්නේද යන්න තහවුරු කර ගැනීම නීතිය පිළිබඳ ප්‍රශ්නයක් වන අතර එය තීරණය කළ යුත්තේ අධිකරණයක් විසින් මිස සමාගම හෝ නීතිපතිවරයා විසින් නොවේ.<br>ඉහත ස්ථාවරය අභියාචනාධිකරණය විසින් පිළිගෙන තිබුණේ එකී ක්‍රියාවන් පිළිබඳ නොතීසි නිකුත් කරමින් සහ සමාගම් දෙකෙහිම කටයුතු විගණනය කිරීම වළක්වාලමින් විගණකාධිපතිවරයාට | සමාගමේ ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යාමේදී රටේ නීතිය පිළිපැදීම සහ අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා මණ්ඩලය සහතික විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අතුරු නියෝග ලබා දීමෙනි. | |
| (උ) 2014 අගෝස්තු 08 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද 2014 අංක 04 චක්‍රලේඛ යෝජනාව | 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්ත නියාමන (සංශෝධන) පනතට අනුව සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් සමාගම වෙන් කිරීම සඳහා යෝජනාවට අනුව රුපියල් මිලියන 100 ක පොලී රහිත අත්තිකාරමක් ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩිංග්ස් ලිමිටඩ් (SLIHL) වෙත මාරු කර ඇත. SLIHL මගින් 2015 අගෝස්තු 31 දින හෝ ඊට පෙර මෙම මුදල මුදල් මගින් හෝ ලාභාංශ පියවීමක් මගින් ආපසු ගෙවිය යුතුය. සංස්ථාපිත SLIHL හි, සමාගමේ එවකට සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂවරයාට, සාමාන්‍ය කොටස් එක බැගින් හිමි ආරම්භක කොටස් හිමියන් ලෙස හඳුනාගෙන තිබුණේ, එකී මූලික කොටස් දෙක, ප්‍රායෝගිකව, භාණ්ඩාගාර ලේකම්වරයා වෙත කඩිනමින් පැවරෙනු ඇති බවට ඇති හැකියාව හා අවබෝධය මතය. කෙසේ වෙතත්, මෙම අත්තිකාරම් මුදල මේ දක්වා SLIHL විසින් ආපසු ගෙවා නොතිබූ අතර එවැනි අත්තිකාරම් පියවීම සම්බන්ධයෙන් සමාගම සහ SLIHL අතර ගිවිසුමක් ඇති කර ගෙන නොතිබුණි. තවද, සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ වාර්තාවලට අනුව, SLIHL හි සම්පූර්ණ කොටස් දෙකක් තවමත් මහා භාණ්ඩාගාරයට පවරා නොතිබුණි. | කළමණාකාරිත්වය විසින් පිළිතුරු සපයා නොමැත. | අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් ලෙස සමාගම විසින් SLIHL වෙතින් මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,080,146,112 ලාභයක්වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභයරු. 1,019,353,91ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.60,792,201 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රු.108,025,331 ක අයභාරය වැඩි වීම හා විකුණුම් පිරිවැය රු.11,101,122 කින් අඩු වීම සහ පරිපාලන වියදම් රු.24,368,560 වෙනස් වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන් පෙර වර්ෂ 2ක හා සසඳා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම්වල ප්‍රතිශතයන් ඇඟයීමට ලක්කර පහත පරිදි දක්වා ඇත.

| දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා | වටිනාකම රු. | | | ප්‍රතිෂත වෙනස | | |
|---|---|---|---|---|---|---|
| | **2019** | **2020** | **2021** | **2019** | **2020** | **2021** |
| ගනුදෙනුකරුවන් සමග එලබෙන ගිවිසුම් වල අයභාරය | 2,064,442,430 | 1,508,188,378 | 1,616,213,709 | 1% | -27% | 7% |
| විකුණුම් පිරිවැය | (316,171,885) | (327,478,463) | (316,377,341) | -3% | 4% | -3% |
| මෙහෙයුම් ලාභය හෝ අලාභය | 1,748,270,545 | 918,058,416 | 924,952,912 | 3% | -37% | 1% |
| මූල්‍ය ආදයම් | 702,332,213 | 517,548,850 | 304,004,575 | 14% | -26% | -41% |
| මූල්‍ය වියදම් | (134,897,235) | (83,243,598) | (28,091,984) | - | -38% | -66% |

## 2.3 අනුපාත විශ්ලේෂණය

ප්‍රධාන අනුපාත පෙර වර්ෂ 2 සමඟ සසඳා පහත පරිදී වේ.

| අනුපාත | 2019 | 2020 | 2021 |
|---|---|---|---|
| ශුද්ධ ලාභ අනුපාත | 104.22% | 95.19% | 76.04% |
| ප්‍රාග්ධන ප්‍රතිලාභ අනුපාතය | 18.47% | 12.27% | 9.60% |
| හිමිකම් මත ප්‍රතිලාභය | 14.77% | 9.61% | 8.99% |
| වත්කම් පිරිවැටුම | 43.92% | 23.43% | 15.27% |
| වත්කම් ප්‍රතිලාභය | 17.67% | 11.83% | 9.18% |
| ජංගම අනුපාතය | 14.21 | 13.15 | 4.81 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 14.19 | 13.12 | 4.80 |
| මූල්‍ය තෝලනය | 1.24 | 1.14 | 1.11 |
| ණය වත්කම් අනුපාතය | 0.20 | 0.13 | 0.10 |
| ණය හිමකම් අනුපාතය | 0.24 | 0.14 | 0.11 |
| මුලු වගකිම් වලට ජංගම අනුපාතය | 0.22 | 0.28 | 0.43 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නෛතික ගාස්තු - 2020 වර්ෂය සඳහා සමාගමේ විගණනය සඳහා විගණකාධිපතිවරයා වෙනුවට ආදේශ කිරිම. | LGTLL ලිපිවල 19 වැනි වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ස්ථානයක සේවයේ නියුක්ත කිරීමට, නඩත්තු කිරීමට, නියෝජිතයන් පත් කිරීමට හෝ සම්බන්ධ කර ගැනීමට සහ සුදුසු යැයි සිතිය යුතු එවැනි ගාස්තුවක් සහ එවැනි ගාස්තුවක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ලබාදේ.<br>ඒ අනුව ගරු නීතිපතිවරයා පෞද්ගලික සමාගම්වලට | සමාගමේ කටයුතු සිදු කිරීමේ දී අධ්‍යක්ෂක මණ්ඩලය රටේ නීතියට අනුකූල විය යුතුය.<br><br>නීති උපදෙස් ලබා ගැනීමේ අවශ්‍යතාවයක් තිබේ නම්, සමාගම විසින් උපදේශකයින් |

| | | |
|---|---|---|
| (i) 2020 වර්ෂය සඳහා සමාගමේ විගණනයෙන් විගණකාධිපතිවරයා වෙනුවට ආදේශ කිරීම සම්බන්ධයෙන් යෝජිත අභියාචනාධිකරණ රිට් අයදුම්පත සඳහා වෘත්තීය සේවාවන් ලබාගෙන තිබුණි. ඒ අනුව 2021 පෙබරවාරි 05 වන දින නීති උපදේශකයින් වෙත සමාගම විසින් රුපියල් මිලියන 2.6 ක් ගෙවා තිබුණි. | නීති උපදෙස් ලබා නොදෙන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය එකී ජනාධිපති නීතිඥවරයාගේ සේවය ඉල්ලා ඇත.<br>සමාගම් පනතේ විධිවිධාන අනුව තමන් කැමති විගණකවරයෙකු පත් කර ගැනීම සඳහා කොටස් හිමියන්ගේ උනන්දුව සහ අයිතිය සුරක්ෂිත කිරීමේ පියවරක් ලෙස, PWC විගණක ලෙස සිදු කල එම පත්වීමට විගණකාධිපතිවරයා විරුද්ධ වුවහොත් පෙනී සිටීමට සුදුසු නීතිඥයෙකුගේ සේවය සමාගම ඉල්ලා තිබුණි.<br>එබැවින් එම මුදල ගෙවා ඇත්තේ එම නීතිඥවරයාට සහ ඔහුගේ කනිෂ්ඨයන් සඳහා නීතිඥවරයා ලෙස රඳවා තබා ගැනීම සඳහා ගරු අභියාචනාධිකරණ උපදේශන සඳහා, උපාය මාර්ගික සහ නීති උපදෙස් සඳහා ලිපි ලේඛන පරීක්ෂා කිරීම සඳහා, සහ පෙත්සම් සහ දිවුරුම් ප්‍රකාශය කෙටුම්පත් කිරීම සහ විසඳීම සඳහා වේ. | තෝරා ගැනීමේදි හා සේවාව ගැනිමේ දි 2007 අගෝස්තු මස ශ්‍රී ලංකා ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. තවද, සමාගම සෑම විටම අවංකභව පවත්වා ගත යුතු අතර අනාගතයේදී මෙය සිදු වීම වළක්වා ගත යුතුය. |
| (ii) නීති උපදෙස් ලබා ගැනීමෙන් පසු, සමාගම විසින් 2021 මැයි 22 දින අභියාචනාධිකරණයේ රිට් අයදුම්පත් ආරම්භ කර තිබුණේ විගණකාධිපතිවරයාගේ ව්‍යවස්ථාපිත බලය අභියෝගයට ලක්කරමිනි.<br>කෙසේ වෙතත්, 2021 ජූලි 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව සමාගම විසින් නඩුව ඉල්ලා අස්කර ගෙන තිබුණි. එම නඩුවට අදාළ නීති ගාස්තු රුපියල් මිලියන 8.125 ක් 2021 ජුනි මාසයේදී සමාගම විසින් ගෙවා තිබුණි | ප්‍රධාන කොටස් හිමියා 2021 ජූලි 20 දිනැති ලිපිය මගින් LGTLL හි අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දී ඇත. 2021/7/22 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සමාගමේ මූල්‍ය කටයුතු පරීක්ෂා කිරීම සඳහා විගණකාධිපතිවරයා පත් කිරීමට පියවර ගැනීමට තීරණය කරන ලදී. LGTLL වෙත විගණකාධිපතිවරයා පත් කර ගැනීම සම්බන්ධයෙන් 2021/07/2021 දිනැති ලිපිය මගින් LGTLL ප්‍රධාන කොටස් හිමියා විසින් 2021 අප්‍රේල් 23 වන දින ඉදිරිපත් කරන ලද බලපත්‍රය අවලංගු කිරීම සැලකිල්ලට ගෙන අභියාචනා රිට් අයදුම්පත්‍ර අංක: CA Writ 286/2021 සහ CA Writ 287/2021 අධිකරණයෙන් ඉල්ලා අස්කර ගැනීමේ අවශ්‍යතාවය මතු විය. එහි දී අධිකරණය විසින් වගඋත්තරකරුවන්ට විධිමත් දැන්වීමක් නිකුත් කර විගණකාධිපතිවරයාට LGTLL සමාගම 2021 සැප්තැම්බර් 21 දක්වා විගණනය කිරීම වළක්ව ඇත. එබැවින් විගණකාධිපතිවරයාට තම රාජකාරී කටයුතු ආරම්භ කළ හැක්කේ ඉහත සඳහන් අතුරු නියෝගය අධිකරණයෙන් නිෂ්ප්‍රභා කිරීමෙන් පසුව හෝ මෙම නඩු ඉල්ලා අස්කර ගැනීමෙන් පසුවය. අභියාචනාධිකරණය එකී ක්‍රියාමාර්ග පිළිබඳ නොතීසි නිකුත් කළ අතර විගණකාධිපතිවරයාට සමාගමේ කටයුතු විගණනය කිරීම වළක්වමින් අතුරු නියෝගයක් නිකුත් කළේය. | |
| (iii) එම කාරණයට අදාළව දැරූ රුපියල් මිලියන 10.725 මුළු වියදම ආර්ථික නොවන වියදම් ලෙස නිරීක්ෂණය විය. | සමාගම වෙනුවෙන් අභියාචනාධිකරණයේ පෙනී සිටි කීර්තිමත් නීතිඥවරුන් වන ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා සහ ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා මහතා මේ සම්බන්ධයෙන් සිය ස්ථාවර මතය ඉදිරිපත් කළහ. ශ්‍රී ලාංකේය නීති පද්ධතිය ඉංග්‍රීසි නීති ක්‍රමයේ නීතිඥ-සේවාදායක සබඳතාව පවත්වාගෙන | |

| | |
|---|---|
| | යාමේ සම්ප්‍රදාය භාවිතයන් වලින් පොහොසත් ය. ගෙවීම් කිරීම සහ අනෙකුත් අදාළ කාරණා සම්බන්ධයෙන් මෙම ක්ෂේත්‍රයේ ව්‍යුහයක් හෝ අදාළ රීතියක් නොමැත. ඒ අනුව උසාවියේ නඩු පවරන්නාගේ අයිතිවාසිකම් ආරක්ෂා කළ හැකි කීර්තිමත් සහ දක්ෂ නීතිඥයෙකුට ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් සේවාදායකයාට කේවල් කිරීමේ බලයක් නොමැත. එම මුදල ආර්ථික නොවන වියදමක් ද යන්න තහවුරු කර ගැනීම සඳහා එම හෝ සමාන උපදේශකයන්ගේ නෛතික ගාස්තු පිළිබඳ වෙළඳපල සමීක්ෂණයක් කිරීම සුදුසුය. |
| (iv) විගණකාධිපතිවරයාට විගණනය සිදුකිරීමට නීතිමය බාධාවක් නොමැති බවට නීතිපතිවරයා පවා සිය මතය ප්‍රකාශ කර තිබූ අතර සමාගම විශාල මුදලක් වැය කරමින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | නීතිපතිවරයා ලබාදී ඇත්තේ මතයක් පමණයි. නීතිපතිවරයාගේ මතය රටේ නීතිය ලෙස සලකන්නේ නැහැ. පවතින නීතියට අනුව, ව්‍යවස්ථාවේ, විශේෂයෙන්ම එහි 154 වැනි වගන්තියේ සහ ජාතික විගණන පනතේ අඩංගු විධිවිධානවල අදාළත්වය පිළිබඳව සමාගම ජොෂ්ඨ ජනාධිපති නීතිඥවරයෙකුගේ මතයක් ලබාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය එකී මතය සැලකිල්ලට ගෙන ඇති අතර ආධාර මතයට අනුකූලව LGTLL විසින් අභියාචනාධිකරණයේ අංක CA Writ 286/2021 සහ 287/2021 දරන ක්‍රියාමාර්ගය ආරම්භ කරන ලදී. අභියාචනාධිකරණය එකී ක්‍රියාවන් පිළිබඳ නොතිසි නිකුත් කළ අතර සමාගම් දෙකෙහිම කටයුතු විගණකාධිපතිවරයාට විගණනය කිරීම වළක්වමින් අතුරු නියෝගයක් නිකුත් කළේය. |

## 3.7 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.) "ලිට්‍රෝ ඔක්සිජන්" නමින් නව නිෂ්පාදන වර්ගයක් ස්ථාපිත කිරීමටත්, රජයේ තක්සේරුව මත රුපියල් 500 ක අත්තිකාරම් මුදලක් ගෙවා SLRDC වෙතින් කෙරවලපිටියේ අක්කර 22 ක පමණ ඉඩමක් සහ ගොඩනැගිල්ලක් වසර 50 කට බදු ගැනීමටත් ඔක්සිජන් පිරවුම්හල ඉදිකිරීමට සහ/හෝ අතිරේක LPG මෙහෙයුම් සහ ගබඩා පුළුල් කිරීමේ ව්‍යාපෘතියක් හෝ ඊට අදාළ වෙනත් ඕනෑම කටයුත්තක් ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා මෙම ඉඩම භාවිතා කරන්න අධ්‍යක්ෂ මණ්ඩලය 2021 මැයි 24 වැනි දින පැවති රැස්වීමේදී අනුමත කර ඇත. ඒ අනුව ඉඩම සඳහා අත්තිකාරම් ගෙවීමක් ලෙස 2021 මැයි 31 රුපියල් මිලියන 500ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, එම ඉඩමේ ඔක්සිජන් පිරවුම්හල ඉදිකිරීමේ අනුමත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර | කළමනාකාරිත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | අදාළ බලධාරීන්ගේ අනුමැතිය ඇතිව සමාගම විසින් මෙම දේපල අපේක්ෂිත අරමුණ සඳහා හෝ වෙනත් සුදුසු කටයුත්තක් සඳහා භාවිතා කළ යුතුය. |

| | | |
|---|---|---|
| නොතිබූ අතර, එම ඉඩම ප්‍රයෝජනයට ගැනීමේ ඉදිරි සැලැස්ම මෙතෙක් තීරණය කර නොමැත. | | |
| (ආ.) වසර 10ක කාලයක් සඳහා හම්බන්තොට මෙහෙයුම් මධ්‍යස්ථානයේ LPG ආනයනය, ගබඩා කිරීම, හැසිරවීම සහ බෙදා හැරීම සඳහා සමාගම ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ 2013 නොවැම්බර් 20 වැනි දින බදු ගිවිසුමකට එළඹී ඇති අතර පසුව එය 2017 දෙසැම්බර් 08 වන දින හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහය (පුද්ගලික) සමාගම සමඟ නවීකරණය කරන ලදී. වසර 8 ක් සඳහා සමස්ථ බදු වාරිකය ලෙස රු. මිලියන 668.55 (බදු ඇතුළුව) ගෙවා ඇති අතර ඉතිරි වසර දෙක සඳහා සමස්ථ බදු වාරිකය ලෙස රුපියල් මිලියන 233.84 (බදු හැර) ගෙවිය යුතුය. 2013 නොවැම්බර් 20 සිට 2021 දෙසැම්බර් 31 දක්වා හම්බන්තොට වරායට පැමිණ ඇත්තේ මෙට්‍රික් ටොන් 10,075ක සමස්ථ වටිනාකම් සහිත නැව්ගත කිරීම් 6ක් පමණක් බව නිරීක්ෂණය විය. එබැවින් සමාගම විසින් එම පහසුකම සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගෙන නොතිබූ අතර සැලකිය යුතු මුදලක් කල්බදු කුලී ලෙස ගෙවනු ලැබේ. මෙට්‍රික් ටොන් 2,700 ක ගබඩා ධාරිතාවක් ඇති එම පහසුකම අඩු මාසික කොන්ත්‍රාත්තු මිල (CP) යටතේ ලබා ගැනීම සඳහා පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය භාවිතා කර නොමැති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | 2017 වසරේදී සිලින්ඩර පිරවුම් කම්හලක් පිහිටුවීම සඳහා මුලපිරීම් සිදු කර තිබූ නමුත් හම්බන්තොට වරායේ හිමිකාරිත්වය වෙනස් වීම මගින් ඇති වූ අවිනිශ්චිතතාවයන් හේතුවෙන් එය කල් දමන ලදී. කෙසේ වෙතත්, එම පහසුකම පූර්ණ පරිමාණයෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා පිරවුම් කම්හල පිහිටුවීම කඩිනම් කර වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීමට පියවර ගෙන ඇත. | මෙම දේපල සාමාන්‍ය ජනතාවට සේවය කිරීම සඳහා සමාගමේ අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමට සමාගම අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |